1992 අංක ...2... දරණ දකුණු පළාතේ

<u>මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය.</u>

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ ප්‍රඥප්තිය 1992 අංක ..2.. දරන .....දකුණු.පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

දකුණු පළාතේ 1990 අංක 7 දරණ මුදල් [illegible] 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. මෙහි මින් මතු 'ප්‍රධාන ප්‍රඥප්තිය' යනුවෙන් සඳහන් කරනු ලබන 1990 අංක 7 දරන දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ අගට පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"එසේ වුවද, යම් ව්‍යාපාරයක යම් පූර්ව කාර්තුවක් සඳහා වූ පිරිවැටුම රුපියල් දශ ලක්‍ෂය ඉක්මවන අවස්ථාවකදී, තදනන්තර කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්ද පහත දැක්වෙන ආකාරයෙන් ගෙවනු ලැබිය හැකිය:-

(අ) පූර්වයෙන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් තුනෙන් එකක්. මෙය ඊළඟට එළඹෙන කාර්තුවේ දෙවන මාසයේ පහළොස් වන දිනට පෙර ගෙවිය යුතු ය;

(ආ) පූර්වයෙන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් තවත් තුනෙන් එකක්. මෙය ඊළඟට එළඹෙන කාර්තුවේ තුන්වන මාසයේ පහළොස්වන දිනදී හෝ ඊට පෙර ගෙවිය යුතු ය;

(ඇ) ඊළඟට එළඹෙන කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දේ ඉතිරි කොටස. මෙය ඒ කාර්තුව අවසාන වීමෙන් පසු එළඹෙන ප්‍රථම මාසයේ පසළොස්වන දිනට පෙර ගෙවිය යුතු ය."

එසේ නොගෙවන ලද යම් බද්දක් ගෙවීම පැහැර හරින ලද බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බද්ද ගෙවනු ලැබිය යුත්තේ යම් තැනැත්තෙකු විසින් ද ඒ තැනැත්තා හෝ ඒ බද්ද එක් තැනැත්තකුට වැඩි දෙනෙකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ ගෙවිය යුතුව ඇති අවස්ථාවක, ඒ තැනැත්තන්ගෙන් එක් එක් තැනැත්තා සහ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු මේ පණතේ කාර්ය සඳහා ගෙවීම පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

...2.පිටුවට...

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ (ඈ) ඡේදයේ, "මෝටර් රථයක අයිතිය පිළිබඳව කරනු ලබන සෑම පැවරීමක් සඳහා" යන වචනය වෙනුවට, "මෝටර් රථයක අයිතිය පැවරීමේ සෑම සාධන පත්‍රයක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වැනි වගන්තියේ (5) වන ඡේදයේ (ඊ) අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඊ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 27 දරණ නිති ආධාර පනත යටතේ සපයනු ලබන නීති ආධාර මත නඩු පවරන, විත්ති වාචක ඉදිරිපත් කරන හෝ මැදිහත් වන තැනැත්තකුට්ම පිණිස එකී නීති ආධාර පනත යටතේ අනුමත කර ඇති නීති ආධාර යෝජනා ක්‍රමයේ පාලකවරයා විසින් හෝ තත් කාර්යය සඳහා යථා පරිදි ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධර යකු විසින් සහතික කරනු ලැබූ තැනැත්තකු විසින් නැතහොත් ඔහු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන සියලු ලේඛන."

ප්‍රධාන ප්‍රඥප්තියේ 40වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියේ (2) වන උප වගන්තියේ, "එහෙත් එවැනි සෑම අවස්ථාවකදීම, ඒ සාධන පත්‍රය සහතික කරන නොතාරිස් වරයා විසින් ඒ හේතු ඒ සාධන පත්‍රයේ සහතික කළ යුතු" යන වචන ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 41වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියේ (3) වන උප වගන්තියේ, "අවලංගු කොට නොමැති අලවන මුද්දරයක්" යන වචනය වෙනුවට, "අවලංගු නොකරන ලද්දාවූ අලවන මුද්දරයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 43අ වන වගන්තිය ඇතුළත් කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 43අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:-

එක් පළාතකට වඩා වැඩි පළාත් ගණනක පිහිටි දේපළ සම්බන්ධයෙන් මුද්දර ගාස්තු.

43අ. යම් සාධන පත්‍රයක්, -

(අ) පළාතේ සීමා තුළ එක් කොටසක් ද වෙනත් පළාත් එකක හෝ ඊට වැඩි ගණනක සීමා තුළ අනෙක් කොටසද පිහිටා ඇති යම් නිශ්චල දේපලක් පැවරීමට අදාළ සාධන පත්‍රයක් වන අවස්ථාවකදී, මේ ප්‍රඥප්තියේ යටතේ ඒ සාධන පත්‍රය සඳහා අය කළ යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර, විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රයෙහි අලවා තිබේ නම් හෝ, ඒ දේපලෙහි අනෙක් කොටස පිහිටා ඇත්තේ යම් වෙනත් පළාතක හෝ පළාත් වල සීමා තුළ ද අවස්ථාවෝචිත පරිදි, ඒ වෙනත් පළාතේ හෝ පළාත් වල මුදල් ප්‍රඥප්තිය යටතේ අය කළ යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර ඒ ප්‍රඥප්තියේ විධි විධාන සලස්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රයෙහි අලවා තිබේ නම්, ඒ දේපළ සම්බන්ධයෙන් ඒ සාධන පත්‍රය යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය; නැතහොත්,

(ආ) එක් නිශ්චල දේපලක් හෝ එකකට වැඩි නිශ්චල දේපළ සංඛ්‍යාවක් පළාතේ සීමා තුළ පිහිටා ඇත්තාවූ ද අනෙක් දේපළ එකක් හෝ වැඩි ගණනක් වෙනත් පළාත් එකක හෝ ඊට වැඩි ගණනක සීමා තුළ පිහිටා ඇත්තා වූ ද විටක ඒ දේපල

.....4 පිටුවට.

පැවිරීමට අදාළ සාධන පත්‍රයක් වන අවස්ථාවකදී, මේ ප්‍රඥප්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර මේ ප්‍රඥප්තියෙන් විධි විධාන සලස්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රයෙහි අලවා ඇත්තේ නම් හෝ, ඒ අනෙක් දේපළ පිහිටියේ යම් පළාතක හෝ පළාත්වල සීමා තුළ ද, ඒ අනෙක් පළාතේ හෝ පළාත්වල මුදල් ප්‍රඥප්තිය යටතේ අය කළ යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර ඒ ප්‍රඥප්තිවල විධි විධාන සලස්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රයෙහි අලවා ඇත්තේ නම්, ඒ දේපළ සම්බන්ධයෙන් ඒ සාධන පත්‍රය යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ 'රුපියල් එකක මුද්දරයක් ඇලිය යුතුය.' යනවචන වෙනුවට, 'රුපියල් එකක මුද්දර ගැසීම හෝ එකී රුපියලක මුද්දර ගාස්තුව 40 වන වගන්තියේ (2) වන උප වගන්තියේ දක්වා ඇති ආකාරයට නියමිත බැංකුවකට ගෙවනු ලැබිය යුතු ය.!' යන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) ඒ වගන්තියේ (1) වන උප වගන්තියේ 'අධිකරණයකට ඉදිරිපත් කරන ලද හෝ ගොනු කරන ලද හෝ පවරන ලද ලේඛන සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තුවද පහත දැක්වෙන කොන්දේසි මත" යන වචන වෙනුවට, "අධිකරණයක පවරන ලද යම් නීති කෘත්‍යයකදී ඉදිරිපත් කරන ලද හෝ ගොනු කරන ලද ලේඛන සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තුව පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව" යන වචන ආදේශ කිරීමෙන් සහ,

......5 පිටුවට

(ආ) ඒ වගන්තියේ (2) වන උප වගන්තියේ "ඒ ලේඛනයෙහි පිටසන් කළ යුතු ය." යන වචන වෙනුවට, "ඒ ලේඛනයෙහි පිටසන් කළ යුතු අතර, ඉන්පසු ඒ ලේඛනය යථා පරිදි මුද්දර ගැසූ ලේඛනයක් ලෙස සලකනු ලැබිය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 47වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ (1)වන උප වගන්තියේ, "මේ ප්‍රඥප්තියෙන් හෝ වෙනත් යම් ප්‍රඥප්තියකින් අන්‍යාකාර විධි විධාන සලසා තිබේනම්" යන වචන වෙනුවට, "මේ ප්‍රඥප්තියෙන් හෝ වෙනත් යම් ප්‍රඥප්තියකින් වෙනත් ආකාරයකට විධි විධාන සලසා තිබේනම්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 50වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ " අයකළ යුතුව තිබුණු" යන වචනය වෙනුවට, " අය කළ යුතුව තිබුණාවූ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 51වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:-

ගාස්තුව ගෙවිය යුත්තේ කවුරුන් විසින්ද යන වග.

51. ඊට පටහැනිව යම් ගිවිසුමක් තිබුණහොත් මිස, පහත දැක්වෙන තැනැත්තන් විසින් මුද්දර ගාස්තුව ගෙවිය යුතු ය:-

(අ) පැවරීමේ සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වන විට, පැවරුම්කරු විසින්; සහ

(ආ) වෙනත් යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වන විට, ඒ සාධන පත්‍රය පිළියෙල කරන, ලියන හෝ ලියා අත්සන් කරන තැනැත්තා විසින්.

......./ 6 පිටුවට.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ (4) වන උප වගන්තියේ, "ඔහුගෙන් මුද්දර ගාස්තු අයකර ගැනීමට යටත් වන සියලු ක්‍රියා" යන වචන වෙනුවට, " මේ ප්‍රඥප්තිය යටතේ කිරීමට ඔහු යටත්ව සිටියා වූ සියලු ක්‍රියා" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 63වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියේ, " මේ පනත යටතේ ඔහු යටත්ව ඇති" යන වචන වෙනුවට, " මේ ප්‍රඥප්තිය යටතේ ඔහු යටත් විය යුතුය" යන වචන ආදේශ කිරීමේ ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියේ (2) වන උප වගන්තියේ " මුද්දර ගාස්තු අය කළ යුතු නම් එය සාක්ෂිවලදී" යන වචන වෙනුවට, "මුද්දර ගාස්තු අය කළ යුතු වන්නේ නම් වුවද ඒ සාධන පත්‍රය සාක්ෂිවලදී" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තියේ (3)වන උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(4) මේ වගන්තියේ කාර්ය සඳහා, "මුද්දර" යන යෙදුමට, අලවන මුද්දරයක් හෝ ලාංඡිත මුද්දරයක් හෝ 40(2) වන වගන්තිය යටතේ යථා පරිදි නිකුත් කරනු ලැබූමුද්දර ගාස්තු ගෙවූ බවට වූ සහතිකයක් ඇතුළත් වේ."

ප්‍රධාන ප්‍රඥප්තියේ 66වන වගන්තියෙහි අලුත් උප වගන්තියක් ඇතුළත් කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ (2) වන උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(3) මේ වගන්තියේ කාර්ය සඳහා "මුද්දරයක් යන යෙදුමට යම් අලවන මුද්දරයක්, ලාංඡිත මුද්දරයක් හෝ මුද්දර ගාස්තු ගෙවූ බවට 40(2) වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක් ඇතුළත් වේ."

..........7 පිටුවට /

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එකී 68 වන වගන්තිය ඒ වගන්තියේ 68(1) වන උප වගන්තිය ලෙස යළි අංක කිරීමෙන්;

(ආ) එසේ යළි අංක කරන ලද උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(2) (1) වන උප වගන්තියේ කාර්ය සඳහා "මුද්දරයක්" යන යෙදුමට, යම් අලවන මුද්දරයක්, ලාංඡිත මුද්දරයක් හෝ මුද්දර ගාස්තු ගෙවූ බවට 40(2) වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක් ඇතුළත් වේ."

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (7) වන උප වගන්තියේ දැක්වෙන, "මෙහි 5 වන උප වගන්තියේ" යන යෙදුම වෙනුවට,"මෙහි 6 වන උප වගන්තියේ " යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එහි (4) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන්:-

"(4) යම් සාධන පත්‍රයක් මත ගෙවිය යුතු මුද්දර ගාස්තුව 40 වන වගන්තියේ (2) වන හෝ (3) වන උප වගන්තිවල දක්වා ඇති ආකාර යට ගෙවා ඇති අවස්ථාවකදී, 40 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ බැංකුව විසින් නිකුත් කරන ලද ගෙවීම් සහතිකය ඒ සාධන පත්‍රයේ පිටපතට යථා පරිදි අලවා ඇති බව හෝ 40 වන වගන්තියේ (3) වන උප වගන්තියේ දක්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රය කොමසාරිස්වරයා විසින් පිටසන් කර ඇති බව, ඒ සාධන පත්‍රය සහතික කරන මහජන නොතාරිස් වරයා විසින් තම සහතිකය මගින් සහතික කළ යුතු ය;

(ආ) එහි (4) වන උප වගන්තියට ඉක්බිතිවම ඒ වගන්තියේ (5) වන උප වගන්තියේ මෙන් බලපාන පරිදි පහත දැක්වෙන උප වගන්තිය එහි ඇතුළත් කිරීමෙන්:-

" (5) මේ ප්‍රඥප්තිය යටතේ මුද්දර ගාස්තු අය කරනු ලැබිය යුතු යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට, 1991 ජනවාරි 1 වන දින සිට 1991 ජූනි මස 30 වැනි දිනය දක්වා වූ කාලය තුළදී 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ විධි විධාන වලට හෝ මේ ප්‍රඥප්තියේ විධි විධාන වලට අනුකූලව යථා පරිදි මුද්දර ගසා තිබේ නම්, ඒ සාධන පත්‍රය හෝ ලේඛනය යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් හෝ ලේඛනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ XXX1 වන පරිච්ඡේදය සංශෝධනය කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ XXX1 වන පරිච්ඡේදයේ ශීර්ෂ පාඨයේ අධිකරණ දඩ" යන වචන වෙනුවට " අධිකරණ දඩ සහ ගාස්තු" යන වචනය ආදේශ කිරීමෙන් ඒ ශීර්ෂ පාඨය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තිය සංශෝධනය කිරීම.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:-

" අධිකරණ දඩ සහ ගාස්තු.

99.(1) පළාත තුළ අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණයක් විසින් යම් ලිඛිත නීතියක් යටතේ බදු, ගාස්තු හෝ වෙනත් අයකිරීම් අයකර ගැනීම සඳහා පනවනු ලබන දඩ හැර, වැරදි සම්බන්ධයෙන් ඒ අධිකරණය විසින් පනවනු ලබන්නාවූ සහ ඒ අධිකරණය වෙත ගෙවනු ලබන්නාවූ දඩමුදල් අතුරෙන්, යම් ලිඛිත නීතියක් ප්‍රකාර ඒ දඩ මුදල්වලින් ගෙවිය යුතුයයි අධිකරණය විසින් කරනු ලබන යම් විධානය කට යටත්ව, ඒ සියලු දඩ මුදල් පළාත් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

99(2) පළාත තුළ අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණයක් විසින් රැස්කරන ලද සියළුම ගාස්තු පළාත් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

....9 පිටුවට.

ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තිය සංශෝධනය කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තියේ, " ඉන් කිසිවක් සඳහා භාවිත කළ යුතු ආකෘති සහ ගනුදෙනු ලේඛණය" වන වචන වෙනුවට, ඉන් කිසිවක් සම්බන්ධයෙන් වූ ගනුදෙනු සඳහා භාවිත කළ යුතු ආකෘති පත්‍ර සහ ලේඛනය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 104 'අ' වන වගන්තිය ඇතුළත් කිරීම

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 104 'අ' වන වගන්තිය ලෙස බල පැවැත්විය යුතුය:-

පළාත් දිරිගැන්වීමේ අරමුදල.

104 'අ' (1) මෙහි මින් මතු " අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන පළාත් දිරිගැන්වීමේ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය.

(2) 1991 ජනවාරි 1 වන දිනෙන් ආරම්භ වන වර්ෂය සම්බන්ධයෙන් පරිපූරක ආධාර මුදලක් වශයෙන් පළාත් සභාව ඉදිරියේ තබනු ලැබීමට සළස්වනු ලබන මුදල් ප්‍රමාණ සහ ඉන්පසු අරමුදලේ කාර්‍ය සඳහා පළාත් සභාව විසින් වාර්ෂිකව විසර්ජනය කරනු ලබන මුදල් ප්‍රමාණ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) අර මුදලින් පහත දැක්වෙන මුදල් ගෙවනු ලැබිය යුතු ය.

(අ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ සුභ සිද්ධිය සඳහා අමාත්‍යාංශය විසින් අනුමත කරනු ලබන යම් යෝජනා ක්‍රමයකට අනුකූලව අවශ්‍ය වන සියළු මුදල්; සහ

(ආ) කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරනු ලබන යම් ප්‍රඥප්තියක් කාර්‍යක්ෂම ලෙස පරිපාලනය කරනු ලැබීම සහතික කිරීම අරභයා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ යෝජනා ක්‍රමයකට අනුකූලව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ට ගෙවනු ලබන දිරි දීමනා ;

(4) කොමසාරිස්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් විශේෂයෙන් බලය පවරනු ලැබූ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින්, නියමිත කාර්‍ය පරිපාටියට අනුකූලව, අරමුදල පරිපාලනය කරනු ලැබිය යුතු ය.

...ප්තියේ ...ය ...ය කිරීම.

25. මුදල් ප්‍රඥප්තිය නමින් හැඳින්වෙන මුදල් ප්‍රඥප්තියේ සිංහල පාඨයෙහි " විකිණීම" යන වචනය සඳහන් වන තව්රතැනක වුව ද ඒ වෙනුවට " පැවරීම" යන වචනය ආදේශ කිරීමෙන් ඒ ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) " මේ ප්‍රඥප්තියෙහි " යන වචන වෙනුවට, " මේ ප්‍රඥප්තියෙහි " යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) " ඇලෙන මුද්දරය " යන්නෙහි අර්ථ නිරූපණයේ, " 67 (1) වන වගන්තිය " යන යෙදුම වෙනුවට " 76(1) වන වගන්තිය " යන යෙදුම ආදේශ කිරීමෙන්;

(ඇ) " තක්සේරුකරු " යන්නෙහි අර්ථ නිරූපණයෙහි " පණතේ " යන වචනය වෙනුවට " ප්‍රඥප්තියේ " යන වචනය ආදේශ කිරීමෙන් ;

(ඈ) " බලයලත් නියෝජිතයා " යන්නෙහි අර්ථ නිරූපණයෙහි,

(1) වන ඡේදයේ " ප්‍රඥප්තියේ " යන වචනය වෙනුවට " ප්‍රඥප්තියේ " යන වචනය ආදේශ කිරීමෙන්;

(11) එහි (2) වන ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ;

" (2) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා තමා විසින් දෙනු ලබන බලය පැවරීමේ ලිපියෙහි නිශ්චිතව සඳහන් කරුණු සම්බන්ධයෙන් තමාවෙනුවෙන් ක්‍රියා කිරීමට යම් තැනැත්තෙකු විසින් කලින්කල ලිඛිතව බලය පවරනු ලැබුවා වූ ද සමාගම් ( විගණකවරුන්) නියෝග යටතේ විගණනවරයෙකු වශයෙන් ලියාපදිංචි කර ඇති පුද්ගලයකු වන්නා වූ සහ කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලැබූ තැනැත්තකු වන්නාවූ හෝ දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා 1979 ... දරණ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අනුමත කරනු ලැබූ තැනැත්තකු වන්නාවූ ද යම් පුද්ගලයෙක් අදහස් වේ"

.../ 11

(ඉ) " අයකළ යුතු" යන්නෙහි අර්ථ නිරූපණයෙහි, " ලියා අත්සන් කරන ලද" යන වචන වෙනුවට " ලියා අත්සන් කළ" යන වචන ආදේශ කිරීමෙන්

(ඊ) " මුද්‍රාංකනය" යන්නෙහි අර්ථ නිරූපණයේ " යම් කඩවු මුද්‍රණයක්, අකුරු ආයුධයක් හෝ උපකරණයක්;" යන වචන වෙනුවට " යම් කඩවුවක්, ප්‍රරූපයක්, මෙවලමක් හෝ උපකරණයක් " යන වචන ආදේශ කිරීමෙන් ;

(උ) " ලේඛණය" යන්නෙහි අර්ථ නිරූපණයේ, බැඳුම්කරයක් හෝ ඇප පත්‍රයක් " යන වචනවල සිට ඒ ඡේදයේ අවසානය දක්වා වූ සියළු වචන ඉවත්කොට ඒ වෙනුවට, " බැඳුම්කරයක් හෝ ඇපකරයක් ඇතුළත් වේ" යන වචන ආදේශ කිරීමෙන්;

(ඌ) " නිසි පරිදි මුද්දර ගසන ලද" යන්නෙහි අර්ථ නිරූපනයේ, " පිටසන් කිරීමේ සහතිකයක් හෝ ඒ සාධන පත්‍රයේ ඇති බව ද," යන වචන වෙනුවට, " පිටසන් කිරීමේ සහතිකයක් හෝ ඒ සාධන පත්‍රයේ ඇති බව හෝ මුද්දර ගාස්තු ගෙවූ බව දැක්වෙන සහතිකයක් ඒ සාධන පත්‍රයට අමුණා ඇති බව ද" යන වචන ආදේශ කිරීමෙන් ;

(එ) " සාධන පත්‍රය" යන්නෙහි අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

" සාධන පත්‍රය " යන්නට, පළාත තුළ යම් නිශ්චල දේපළක් පැවරීමට හෝ පළාත තුළදී කරනු ලබන යම් මෝටර් වාහනයක් පැවරීමට අදාළ සෑම ලේඛණයක්ම ඇතුළත් වේ ;

(ඒ) " තැනැත්තා" යන්නෙහි අර්ථ නිරූපනයේ " පුද්ගල මණ්ඩලයක්" යන වචන වෙනුවට " පුද්ගල මණ්ඩලයක් හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්" යන වචන ආදේශ කිරීමෙන්;

(ඔ) " ඇටෝර්නි බලය" යන්නෙහි අර්ථ නිරූපණයේ " තැනැත්තා වෙනුවෙන්" යන වචන වෙනුවට " තැනැත්තා වෙනුවෙන් සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඕ) " කාර්කූව" යන්නෙහි අර්ථ නිරූපනයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපනය ඇතුළත් කිරීමෙන්:-

" පැවරුම" යන්නෙන් විකිණීමත් හෝ හුවමාරු කිරීමත් හෝ තෑගි දීමක් අදහස් වන අතර, මියගිය තැනැත්තෙකුගේ බූදලයේ යම් දේපළක් ඊට ප්‍රතිලාභී හිමිකම් ඇති යම් තැනැත්තෙකු වෙත හෝ මියගිය තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රය යටතේ එක් කොට ඇති භාරකරුවකු වෙත, එක් මියගිය තැනැත්තාගේ බූදලයේ පොල්මඃකරුවකු නැතහොත් අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් ප්‍රතිෂ්ඨාවකි තොරව තෑගි කිරීමත්, හුවමාරු කිරීමත් හෝ පැවරීමත් හෝ, එවැ භාරකරුවකු විසින් ප්‍රතිලාභියකු වෙත කරනු ලබන තෑගි කිරීමක්, හුව කිරීමක් හෝ පැවරීමත් හෝ මියගිය භාරකරුවෙකුගේ පොල්මඃකර අද්මිනිස්ත්‍රාසි කරුවකු හෝ භාරකරුවකු විසින් උත්තරජීවී භාරකරුවකු හෝ අලුත් භාරකරුවකු වෙත හෝ ප්‍රතිෂ්ඨාවකින් තොරව කරනු ලැබූ පැවරීමත් ඇතුළත් වන අතර, පොදුවේ දරණ යම් ඉඩමක් බෙදා වෙන්කර ගැනීමේ ඔප්පුවක් හෝ පැවරීම සඳහා වූ ගිවිසුමක් ඊට ඇතුළත් නොවේ ;

(ක) " භාරකරු" යන්නෙහි අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අටත් අර්ථ නිරූපණයට ඇතුළත් කිරීමෙන් :-

" වටිනාකම " යන්න,

(අ) තෑගි කරනු ලැබූ නිශ්චල දේපළක් නොවන යම් දේපළක් සහ යම් දේපළක් සහ යම් දිනයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, තක්සේරුකරුගේ මතය අනුව එදිනට විවෘත වෙළඳපොලේදී ඒ දේපළට ලැබිය හැකි මිල ගණන අදහස් වේ. ;

(ආ) පැවරුම්කරු විසින් 1977 මාර්තු 31 වන දිනදී හෝ ඊට පෙර අත්කර ගන්නා ලද්දා වූ ද පසුව තෑගි කරනු ලැබුවා වූද යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් යෙදී ඇති විට,

....../ 2.

(1) ඒ දේපළ 1977 මාර්තු 31 වන දින දී විකුණන ලද්දේ නම්, තක්සේරුකරුගේ මතය අනුව ඒ දේපළ සඳහා ලැබිය හැකිව තිබුණු මිලට, 1977 මාර්තු 31 වන දිනෙන් පසු සහ ඒ දේපළ එයේ තෑගි කල සාධන පත්‍රයේ දිනයට පෙර ඒ දේපළට යම් වැඩි දියුණු කිරීමක් , වෙනස් කිරීමක් හෝ අලුතුවෙන් එකතු කිරීමක් කර තිබුණේ නම් ඒ සඳහා ගිය වියදම එකතු කිරීමෙන් ලැබෙන මුදල; හෝ

(ii) ඒ දේපළ තෑගි කරන්නට යෙදුණු සාධන පත්‍රයේ දිනයේදී විවෘත වෙළඳපළේ දී ඒ දේපළ විකුණන ලද්දේ නම්, තක්සේරුකරුගේ මතය අනුව , ඒ දේපළ සඳහා ලැබිය හැකිව තිබුණු මිල, යන දෙකින් අඩු මුදල අදහස් වේ;

(ඇ) පැවරුම්කරු විසින් 1977 මාර්තු 31 වන දිනෙන් පසු අත්කර ගන්නා ලදුව පසුව තෑගි කළ යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් යෙදී ඇති විට,

(1) ඒ දේපළ ඒ පැවරුම්කරු විසින් අත්කර ගන්නා ලද දිනයේදී විවෘත වෙළඳපලේදී ඒ දේපල විකුණන ලද නම්, තක්සේරුකරුගේ මතය අනුව, ඒ දේපළ සඳහා ලැබිය හැකිව තිබුණු මිලට, ඒ දේපළ එක් පැවරුම්කරු විසින් අත්කර ගැනීමෙන් පසු සහ ඒ දේපළ තෑගි කිරීමේ සාධන පත්‍රයේ දිනයට පෙර ඒ දේපළට කරන ලද යම් වැඩි දියුණු කිරීමක්/වෙනස් කිරීමක් හෝ එකතු කිරීමක් වේ නම් ඒ සඳහා ගිය වියදම් එකතු කිරීමෙන් ලැබෙන මුදල ; හෝ

(ii) ඒ දේපළ තෑගි කරන්නට යෙදුණු සාධන පත්‍රයේ දිනයේදී විවෘත වෙළඳ පළේදී ඒ දේපළ විකුණන ලද්දේනම්, තක්සේරුකරුගේ මතය අනුව, ඒ දේපළ සඳහා ලැබිය හැකිව තිබුණු මිල, යන දෙකින් අඩු මුදල අදහස් වේ; "